# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,879/4 — 1969 නොවැම්බර් 14 වැනි සිකුරාද — 1969.11.14**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

අ.ආ.කා. අංකය : සී. 162/49 (8)

අග්‍රාණ්ඩුකාරතුමන් විසින් 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥවල 51 වැනි වගන්තිය යටතේ, ජනසතු සේවා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, වී. ඇම්. පීරිස් මහතා, තම රාජකාරීවලට අමතරව, 1969 නොවැම්බර් 18 වැනි දින සිට, පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, ඊ. ජී. ගුණවර්ධන මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් වැඩ බැලීමට පත් කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. බී. ඇල්කඩුවේ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1969 නොවැම්බර් 14 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

11–276/1

---

අ.ආ.කා. අංක : සී. 162/49 (8)

අග්‍රාණ්ඩුකාරතුමන් විසින් 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥවල 51 වැනි වගන්තිය යටතේ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, දෙස්තර ඩී. බී. ගුණසේකර මහතා, තම රාජකාරීවලට අමතරව, 1969 නොවැම්බර් 13 වැනි දින සිට, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, සී. බාලසිංහම් මහතා දිවයිනට පෙරළා පැමිණෙනතුරු, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් වැඩ බැලීමට පත් කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. බී. ඇල්කඩුවේ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1969 නොවැම්බර් 14 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

11–276/2

---

## මිළ පාලන දන්වීම්

**සී. 477 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය** — **අතිරේක ආහාර ද්‍රව්‍ය**

### මිළ පාලන පනත

### නියෝගය

මිළ පාලක (ආහාර) තැන්පත් බුවනෙකබාහු පියන්ගේ වික්ටර් ඇලෙක්සැන්ඩර් ජස්ටින් පූර්ණවංශ සේනාරත්න වන මම, (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මිල පාලක (ආහාර) වෙත පැවරී තිබෙන බලතල අනුව :—

(1) 1969 නොවැම්බර් 2 වෙනි දින අංක 14,878/1 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1969 නොවැම්බර් 2 වෙනි දින අංක සී. 475 දරණ ආහාර මිළ නියෝගය මේ දන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) තවද, මීට යාකර ඇති උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍යයක් මෙරටට ගෙන්වන්නෙකු විසින් තොග වශයෙන් විකිණීමේ දී දළබර හොණ්ඩරයක් ද, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේ දී දළ බර හොණ්ඩරයක් ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක් ද, කොළඹ නගරයේ නාගරික සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිළ මේ දන් පටන් මේ උපලේඛණයේ 2වෙනි, 3 වෙනි හා 4 වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්යය සඳහා—

(අ) උපලෙඛණයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් :

(ආ) උපලේඛණයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගණුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්යය සඳහා " රාත්තල " හෙවත් " රා " යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපෝයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව ද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින් ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළෙඳාමේ ස්වභාවය එනම් වෙළෙඳාම තොග වශයෙන් ද, සිල්ලර වශයෙන් ද යනවග ඇතුලත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බව ද නියම කරමි.

(8) උපලෙඛණයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, එහි මිළත්, උපලෙඛණයේ 2 වෙනි හා 4 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බව ද නියම කරමි.

1969 නොවැම්බර් 14 වෙනි දින අපරභාග 4 ට අත්සන් කරන ලදී.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
මිල පාලක (ආහාර), කොළඹ දී.

## උපලේඛනය

| I වැනි තීරය<br>වර්ගය | 2 වැනි තීරය<br>මෙරටට ගෙන්වන්නෙකු විසින් දළ බර හොණ්ඩර යක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | 3 වැනි තීරය<br>තොග වෙළෙන්දකු විසින් දළ බර හොණ්ඩර යක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | 4 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| කොත්තමල්ලි ... ... ... | — ... | 82 0 ... | 0 84 |
| රතු ළූනු ... ... ... | — ... | 24 0 ... | 0 28 |
| ළූනු (රතු ළූනු හැර වෙනත් සියලුම වර්ග) ... | 30 50 ... | 32 0 ... | 0 34 |

**සැළකිය යුතුයි.**—(i) මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියම මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන් ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකියි.

(ii) මෙරටට ගෙන්වන්නෙකු විසින් අය කරන මිළ හොණ්ඩර 10 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකුණන විට අය කරන මිළ විය යුතුය.

11-277

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.